# පළාත් පාලන ආයතන ඡන්ද විමසීම : මිශ්‍ර සභික නියෝජන ක්‍රමය අභියෝගයට ලක් කරන ලද පශ්චාත් මැතිවරණ ප්‍රතිඵල සමය පිළිබඳ නිරීක්ෂණ, උගත් පාඩම් සහ ඉදිරි දැක්ම

## ස්වායත්ත ආණ්ඩුකරණය

වර්තමානය වනවිට මෙරටේ ප්‍රාදේශීය ආණ්ඩුකරණය ඊට අදාළ ස්වාධීන මෙන්ම ස්වායත්ත ආණ්ඩුකරණ ඒකකයක් ලෙස රටෙහි ස්ථාපිතව පවතී. එය සියවස් ගණනාවක් තිස්සේ අඛණ්ඩව විකාශනය වූ ප්‍රාදේශීය පාලනයේ විභවතාවය ද මනාව ග්‍රහණය කරගත් බලධාරීත්වයෙන් යුත් යාන්ත්‍රණයක් බවට පෙළගැසෙමින් පවතින අයුරු පෙනීයයි. මෙරටේ තෙවැනි මට්ටමේ පාලන ව්‍යුහය බවට පත්ව ඇති පළාත් පාලන ආයතන පද්ධතිය, තම ප්‍රගතියට අදාළ තීරණ ගැනීමේ හෝ එකී තීරණ පොදුජන අභිලාශ සමනය කිරීම සඳහා ක්‍රියාවට නැගීමේ විභවතාවක් සහිත ස්වාධීන ආයතන පද්ධතියක් බවට පත්ව ඇත. මෙම ආයතනික ව්‍යුහයේ ගාමක බලවේගය බවට පත්ව ඇත්තේ මහජන නියෝජිතයන්, තම ප්‍රජාව තුළ ම දිවි ගෙවන්නා වූ අසල්වැසියන්ගේ කැමැත්ත මත සභිකධූරය ලැබීමයි. මෙම නියෝජිතයන් සමූහය මෙරටේ නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් කරනු ලබන තීරණාත්මක බලවේගයයි. . ඊට හේතුව ප්‍රාදේශීය ප්‍රජාතන්ත්‍රවාදය වඩාත් තියුණු හා ගැඹුරු භාවිතාවක් බවට පත් කිරීමෙන් තොරව සාර්ථක පළාත් පාලනයක් නිර්මාණය කරගත නොහැකි බැවිනි. පළාත් පාලනය, ප්‍රාදේශීය පාලනයේ මුදුන් මුල යැයි දේශපාලන චින්තකයෙක් වූ ඇලෙක්සි තොක්විල් පවසන ලද්දේ එබැවිනි.

මෙකී නියෝජිතයන් සමූහය වසර හතරක කෙටි කාල සීමාවක් සඳහා තම ඡන්දදායකයන් මඟින් ලබා ගනු ලබන්නේ වර පත්‍රයක් හෙවත් ජනතාව නියෝජනය කිරීම සඳහා වූ බලපත්‍රයකි. එලෙස ලබාගන්නා බලපත්‍රය උපයෝගී කරගත යුතු ආකාරය, නීති හා පටිපාටි ලෙස ලේඛනගතව තිබුණ ද යම් නියෝජිතයෙක් තම වගකීමෙන් බැහැර වූ කළ ඡන්දදායකයෙකුට ගතහැකි ක්‍රියාමාර්ග ද සීමා සහිතය. එවන් සංදර්භයක ප්‍රජාව මගින් නැගී සිටින පළාත් පාලන ආයතන නියෝජිතයා නිසි වගවීමක් සහිත පුද්ගලයෙක් විය යුතුය යන්න අවිවාදිත කරුණකි.

ලොව කීර්තිධර විද්‍යාඥ ආතර් සී ක්ලාර්ක් වරක් මෙලෙස පැවසුවේය. "ප්‍රජාතන්ත්‍රවාදය හොඳයි හා නරකය යන තර්ක දෙක ම අපට නිතර අසන්නට ලැබෙනවා. ප්‍රජාතන්ත්‍රවාදය පරිපූර්ණ නැහැ. එය යාවත්කාලීන කිරීම හා රටේ හැටියට යම් තරමකට හැඩ ගස්වා ගැනීම අවශ්‍යයි. එසේම සියවස් ගණනාවක් පැවැත ආ ප්‍රජාතාන්ත්‍රික සම්ප්‍රදායන් නූතන තාක්ෂණයේ පිහිටෙන් වඩාත් දියුණු තියුණු කළ හැකිය. සීඝ්‍රයෙන් ගෝලීයකරණය වන අපේ ලෝකයේ දුගීබව පිටුදැක්මට හා සියලු ජනයාගේ ජීවන මට්ටම නගා සිටුවීමට නම් රාජ්‍ය තන්ත්‍රයේ නිසි වගවීම අවශ්‍යයි. එය මධ්‍යම පළාත් හා පළාත් පාලන යන සියලු මට්ටම්වල සිදුවිය යුතුයි" මෙලෙස හඳුන්වාදෙනු ලබන නිසි වගවීමක් සහිත නියෝජිතයෙක් තෝරා ගැනීම එතරම් සුමට අභ්‍යාසයක් නොවේ. එහි පවත්නා සංකීර්ණ හා පැටලිලිසහගත බව වරක් සාහිත්‍යාත්මකව විග්‍රහ කරමින් හෙළහවුලේ අදියුරු කුමාරතුංග මුනිදාසයන් සඳහන් කරන ලද්දේ "පියෙක් තම රූමත් දියණිය සරණ පාවා දීම සඳහා සුදුසු සහකරුවෙක් තෝරා ගැනීමට වෙහෙසෙන්නේ යම් සේද, ඡන්දදායකයා ද සුදුසු අපේක්ෂකයෙක් තෝරා ගැනීම සඳහා ඒසා ප්‍රමාණයක් වෙහෙසිය යුතු බවයි" එලෙස වෙහෙසක් ගන්නේ වුවද ඊට සාධාරණයක් ඉටුකිරීමට නම් වඩාත් සාධාරණ මෙන්ම ගුණාත්මක තත්ත්වයෙන් ඉහළ මැතිවරණ ක්‍රමවේදයක් පැවතිය යුතුය. මෙරටේ ඡන්දදායකයන් සඳහා යම් නියෝජනයක් ලබා දීමේ සමාරම්භය වඩාත් ක්‍රමවත්ව මෙරටේ සිදුවන්නේ සියවසකටත් පෙර සිටය. ව්‍යවස්ථාදායකය සඳහා තෝරා පත් කිරීම සීමිත නියෝජනයක් හෝ ආණ්ඩුකාරවරයාගේ නම් කිරීමක සිට සරළ බහුතර නියෝජන ක්‍රමයක් දක්වා ක්‍රියාත්මකව පැවතිණි. එහෙත් සරළ බහුතර ඡන්ද ක්‍රමයකදී ජනතා අභිලාශ එලෙසම විද්‍යමාන නොවන්නේය යන පදනම යටතේ මෙරටේ ඡන්ද ක්‍රමය සපුරා වෙනසකට ලක් කරන ලද්දේ වසර 1978 දීය.

## කොන්දේසි විරහිතව මනාප ක්‍රමය පිටුදැකීම

ඒ සමානුපාතික මැතිවරණ ක්‍රමයක් මගිනි. ඊට ආනුශාංගිකව එක් කරන ලද මනාප ක්‍රමය ද මෙරටේ පාලන ස්ථර තුන සඳහා පවත්වන මැතිවරණ සඳහා උපයෝගී කර ගැනීම ද සාමාන්‍ය ලක්ෂණයක් විය. එහෙත් කාලයාගේ ඇවෑමෙන් ගොඩ නැගුණු සමාජ මතය වූයේ සමානුපාතික ක්‍රමයට ඈඳන ලද මනාප ක්‍රමය දේශපාලන පක්ෂ හා අපේක්ෂකයන් අතර ජනිත කර අති නොසන්සුන්තාවය

පාලනය කරගත නොහැකි මට්ටමක් කරා ළඟා වෙමින් පවතින බවයි. මීට අදාළව තර්ක හා ප්‍රතිතර්ක රාශියක් අද දක්වාම පළවන අතර එකී සංවාද බොහෝමයක ම පවතින පොදු ලක්ෂණ පිළිබඳව ද සළකා බැලිය යුතුව ඇත. එනම් මනාප ක්‍රමය වහා පිටුදැකිය යුතු විලම්භිත ක්‍රමයක් යැයි කරුණු දක්වන විවේචකයන් කිසිවෙක් එහි පවත්නා සාධනීය ලක්ෂණ පිළිබඳ ප්‍රසන්න බවකින් එකී සංවාද සඳහා සහභාගී වී නැති බවයි. මෑත කාලීනව පැන නැගී ඇති මාර්තු 12 වැනි ස්වේච්ඡා ජන බලවේග තම නිරන්තර අවධානයට ලක්කොට ඇති පිරිසිදු දේශපාලන සංස්කෘතියක් නිර්මාණය කිරීම පිළිබඳ සාකච්ඡාව ද මෙහිලා ආදේශ කර ගත හැකිය.

එනම් මෙරටේ පිරිසිදු දේශපාලන සංස්කෘතියක් ප්‍රතිනිර්මාණය කර ගැනීම අභියස පවත්නා බාධා නිවැරදිව හඳුනා ගැනීමයි. ඊට අදාළ ප්‍රමුඛතා කවරාකාර වුවද පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයත්, දේශපාලන මූල්‍යකරණයත් ඊට අදාළ තීරක කාර්යභාරයක් ඉටු කරන්නේ ය. මෙරටේ දේශපාලන පක්ෂ අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත් තලයක තබා දේශපාලන මූල්‍යකරණය, එසේ නැතහොත් යටත් පිරිසෙන් මැතිවරණ ප්‍රචාරක වියදම් සීමා කිරීම සඳහා වන නියාමනයන් හා නීති හඳුන්වා දී තිබුණේ නම් මෙරටේ ඡන්දදායකයන් මනාප ක්‍රමය පිටුනොදකිනු ඇතැයි යන්න අපගේ විශ්වාසයයි. ධනයෙන් ආඪ්‍ය හෝ වඩාත් ජනාදරයට පත් අපේක්ෂකයෙක් වැඩිම මනාප ලබා සභාවකට මහජන නියෝජිතයෙක් ලෙස පත්වීම දුර්භාග්‍යවත් හා වහා මැඩලිය යුතු ව්‍යවසනයක් නොවේ. එහිලා සිදුවිය යුතු නිවැරදි ක්‍රමවේදය නම් සෑම අපේක්ෂකයෙක් සඳහා ම තරඟ කිරීමට සුදුසු "සමබිමක්" නිර්මාණය කිරීමයි.

ජාතික මට්ටමමේ පවත්නා දේශපාලන ප්‍රවාහය, පළාත් පාලනයට ද බලපෑම් කිරීම නිරායාසයෙන් සිදුවන්නකි. මැතිවරණ ක්‍රමයේ බලපෑම් ද එලෙසමය. වසර 2007 ජුනි මස 05 වැනි දින ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව මගින් නිකුත් කරන ලද මැතිවරණ ප්‍රතිසංස්කරණය පිළිබඳ පාර්ලිමේන්තු තේරීම්කාරක සභාවේ අතුරු වාර්තාව මෙරටේ පාලන ස්ථර ත්‍රිත්තවය සඳහා ම පැවැත්විය යුතු මැතිවරණ පිළිබඳව තම ස්ථාවරය දක්වා ඇත. එහි පළාත් පාලන මැතිවරණ සඳහා යෝජිත නිර්දේශ ලෙස ප්‍රමුඛව සඳහන් කොට ඇත්තේ තත්කාලීනව පවත්නා පළාත් පාලන සීමා නැවත නිර්ණය කොට "කොට්ඨාශ" නමින් නව ඒකකයක් නිර්මාණය කිරීමත්, එතෙක් අනුදත් මැතිවරණ ක්‍රමය එකී කොට්ඨාශ පදනම් කර ගනිමින් පැවැත්විය හැකි ක්‍රමයක් පිළිබඳ ව අවධානය යොමු කිරීමත් ය.

එලෙස යෝජිත නිර්දේශ යම් ඇල්මැරුණු ස්වාභාවයකින් පැවති අතර වසර 2010 දී පමණ නැවතත් එකී සංවාදය ප්‍රාණවත් මෙන්ම සජීවී එකක් බවට පරිවර්තනය වූ සෙයක් පෙනී යයි. එහි කූඨප්‍රාප්තිය වූයේ වසර 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතයි. එකී පනත මගින් යෝජිත පළාත් පාලන මැතිවරණ ක්ෂේත්‍රයේ වෙනස්කම් කාලීනව වැදගත් යැයි සිතූ නිසාදෝ ඊට පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සංශෝධන සහිතව තම අනුමැතිය ලබාදෙන ලද්දේ බරපතල බේදීමකින් තොරවය.

## නව ක්‍රමයක් - නව ප්‍රවේශයක්

මෙම පනත සඳහා පාර්ලිමේන්තු අනුමැතිය හිමිවුව ද අදාළ මැතිවරණය පැවැත්වීම දිනෙන් දින කල්යෑම ද සමාජයේ බරපතල සාකච්ඡාවට හා විවේචනයට ලක්විය. එහෙත් මෙම ලිපියේ අරමුණ මේ වන විට පවත්වා ඇති පළාත් පාලන ඡන්ද විමසීම මගින් උගත් පාඩම් පිළිබඳ අවධානය යොමු කිරීම බැවින් ඡන්ද විමසීම කල් යෑමට හේතු පාදක වූ සිද්ධීන් විග්‍රහ කිරීමක් සිදුකර නැත. වසර 2018 පෙබරවාරි මස 10 වැනිදා පවත්වා අවසන් වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා මූලික වශයෙන් නීතිමය පසුබිම ගොඩනගුනේ

- පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනත (262 වන අධිකාරය) (මව් පනත)
- 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත
- 2016 අංක 01 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත හා
- 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත සහ තවත් ඊට ආනුශංගික සංශෝධිත පනත් කිහිපයක් මෙන්ම මැතිවරණ කොමිෂන් සභාව අවස්ථාවෝචිතව ප්‍රකාශයට පත් කරනු ලබන චක්‍රලේඛ, දන්වීම්, මාර්ගෝපදේශ වලට අමතර වශයෙනි. මෙහිලා අතිශය තීරණාත්මක ප්‍රතිපත්තිමය තීන්දුව වූයේ මිශ්‍ර සහික සමානුපාතික නියෝජන ක්‍රමයක් ලෙස හැඳින්වෙන මැතිවරණ ක්‍රමයක් උපයෝගී කර ගැනීමේදී භාවිතා කළ යුතු අනුපාතය කවරාකාර විය යුතු ද යන්නයි. විවාදාත්මක සංවාදයක් වූ එය නීතිමය

ප්‍රතිපාදනයක් ව කළඑළි දුටුවේ 2017 අංක 16 දරන පළාත් පාලන ආයතන සංශෝධන පනත මගිනි. එහිලා අනුදත් ක්‍රියාමාර්ගය වූයේ කොට්ඨාශ සහ සමානුපාතික අනුපාතය පිළිවෙළින් 60-40 යන සීමාවන්හී රඳවා ගැනීමයි. (එහෙත් සභිකයන් තේරීමේ දී, තෝරා ගැනීම සමස්ථයක් ලෙස 100% ක්ම සමානුපාතික විය).

## පශ්චාත් මැතිවරණ ප්‍රතිඵල සමය

මෙලෙස පවත්වන ලද ඡන්ද විමසීමේ ප්‍රථිඵල නිකුත් වීමත් සමග ජනිත කරන ලද පශ්චාත් මැතිවරණ ප්‍රතිඵල සමය නව මැතිවරණයේ හිතකර අහිතකර බව මනින මිම්මක් වූ අතර ඒ පිළිබඳ විචාරාභිමුඛ වූ ඉතා සුළුදෙනෙක් හැර බහුතරයක් ජනගත කරන්නට උත්සාහ කරන ලද අදහස මෙපරිදිය. එනම් නව මැතිවරණ ක්‍රමයක් හඳුන්වා දී, සමස්ත දේශපාලන පරිසරය ම අවුලෙන් අවුලට පත් කර ඇති බවත් කාන්තා නියෝජනය සඳහා ලබා දී ඇති අවස්ථාව කෘතීම ව නිර්මාණය කරන ලද්දක් බවත් ය. තව ද සභිකයන් සංඛ්‍යාව දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි කිරීම යනු ජාතික ධනය නාස්ති කිරීම සඳහා විවර කරන ලද තවත් එක් දොරටුවක් බවයි. එමෙන්ම ප්‍රධාන දේශපාලන පක්ෂ සඳහා ස්ථාවර බලයක් නොලැබෙන ලෙස සකස් කොට ඇති නව දේශපාලන ක්‍රමය ස්ථාවර සභාවක් පවත්වා ගැනීම සඳහා අනුබල සැපයීමක් නොකරන්නේ ය යන්නයි. එපමණක් නොව පළාත් පාලන ආයතන ප්‍රධානීන් තෝරාගැනීමේ ක්‍රමවේදය මුදලට පාවා දීම සඳහා මෙම නව ක්‍රමය මගින් අවස්ථාවක් උදා වී ඇති බවටත් නැගුණු චෝදනා අපමණය. කවර සාධනීය ලක්ෂණ පැවතියේ වුවද පශ්චාත් මැතිවරණ ප්‍රතිඵල සමය තුළ නැවත නැවතත් පුනරුච්චාරණය කරන ලද ඉහත අදහස් බැලුබැල්මට ඡන්දදායකයා මන්දෝත්සාහී කරන ප්‍රකාශ වන අතර නව ක්‍රමය තුළින් ජනිත කරන ලද කිසිදු සුභවාදී ලක්ෂණයක් නැතැයි යමෙකුට හැඟීයානම් එය ද විමතියට කරුණක් නොවේ. ඉහත කරුණු එකිනෙකට පිළිතුරු සැපයීම මෙම ලේඛණය දිගු කරන්නක් බැවින් පොදුවේ අදහස් දැක්වීමක් මෙහිලා සිදුකෙරේ.

නව මැතිවරණ ක්‍රමය පිළිබඳව පැවති සංවාද සහ සාකච්ඡා හරහා පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය, මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ නිරීක්ෂණ සංවිධාන ප්‍රමුඛ සිවිල් සමාජ සංවිධාන සිදුකරන ලද කාර්යභාරය සැළකිය හැක්කේ පහසුකාරකත්වය දැක්වීමක් ලෙස සහ එකී පිරිස් හඳුනාගත යුත්තේ මෙම නව මැතිවරණ ක්‍රමය එකලෙස වැළඳ ගනිමින් එය ප්‍රවර්ධනය කිරීමේ කාර්යය උරදරා ගත් පිරිසක් ලෙස නොවේ. එය ඉතා පුළුල් සාකච්ඡාවකට බඳුන්කොට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ලද්දේ ව්‍යවස්ථාදායකයේ සාමාජිකයන්ය. එබැවින් මෙම නව ක්‍රමය මගින් ජනිත කරන ලද බලපෑමේ කීර්තිය හෝ යම් දෝෂාරෝපණයක් වේ නම් එය ලැබිය යුතු පාර්ශවය වන්නේ දේශපාලන පක්ෂ නායකයන් ප්‍රමුඛ ව්‍යවස්ථාදායකයේ නියෝජිතයන්ය.

## බැහැර කිරීමේ ප්‍රජාතන්ත්‍රවාදයක්

කාන්තා නියෝජනය පිළිබඳ නැගෙන දෝෂාරෝපණය දෙස බැලූ විට පෙනී යන්නේ ශ්‍රී ලංකාව තවමත් "බැහැර කිරීමේ ප්‍රජාතන්ත්‍රවාදයක්" මත සිටිමින් තීරණ ගන්නා බවයි. මහාචාර්ය ජයදේව උයන්ගොඩයන් මේ පිළිබඳ දක්වා ඇති මතය විමසා බැලීම මෙහිලා වැදගත් ය. ඔහු ගෙනෙන එක් තර්කයක් වන්නේ "නැත්තන්ට අවාසි සිදුවන, ඇත්තන්ට වාසි සිදුවන අසමාන තත්ත්වයක්" (unequal - equality) ඇති කරන ආකාරයේ ලිබරල් සමානාත්මතා මූලධර්මය වෙනුවට "නැත්තන්ට ද වාසි ලබාදිය හැකි සාධනීය ආකාරයේ අසමාන - සමානත්වයක් (positive unequal- equality) සහිත රාජ්‍ය ප්‍රතිපත්තියක් නිර්මාණය කළ යුතු බවයි. එහිලා එක් විකල්පයක් වන්නේ මෙලෙස ලබා දී ඇති කෝටාවයි. එපමණක් ද නොව කාන්තා නියෝජනය කිසිසේත් සාක්ෂාත් කළ නොහැකියැයි දක්වා ඉතා විශාල කලබගෑනියක් ද මෙකල සිදු විය. එහෙත් අද වනවිට නිර්මාණය වී ඇති පසුබිම සිත්ගනා සුළු ය. මැතිවරණ කොමිෂන් සභාවේ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් දේශපාලන පක්ෂ, කාන්තා සභිකයන් නම් කිරීම සිදුකොට තිබූ අතර දැනට ප්‍රකාශිතව ඇති සංඛ්‍යා ලේඛණ පිරික්සීමේ දී පැහැදිලි වන්නේ කාන්තා නියෝජනය සඳහා ඉතා සවිමත් පදනමක් මෙතුළින් නිර්මාණය වී ඇති බවයි. පහත දත්ත පරීක්ෂා කිරීමෙන් ඒ බව තහවුරු වේ

## කාන්තා නියෝජනය තහවුරු වී ඇති ආකාරය :

| දිස්ත්‍රික්ක ගණන | පළමු නාම යෝජනා පත්‍රයෙන් නාමයෝජනා කළ යුතු අවම කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව | කොට්ඨාශ මට්ටමින් පත් වූ කාන්තාවන් සංඛ්‍යාව | අතිරේක නාමයෝජනා පත්‍රයෙන් නාමයෝජනා කළ යුතු අවම කාන්තා අපේක්ෂිකාවන් සංඛ්‍යාව | ලැයිස්තුවලින් නම් කරන ලද කාන්තාවන් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 25 | 696 | 535 | 1998 | 1984 |

- මැතිවරණ කොමිෂන් සභාව මෙතෙක් නිල වශයෙන් තහවුරු නොකරන ලද දත්ත මත පදනම් ව මෙම වගුව සකස්කර ඇති බව කාරුණිකව සළකන්න.

නව මැතිවරණ ක්‍රමය යටතේ මෙතරම් විශාල සංඛ්‍යාවකගෙන් යුත් සභිකයන් ප්‍රමාණයක් ඇතුළත් කිරීම සඳහා බලපාන ලද මූලිකම සාධකය වූයේ මිශ්‍ර මැතිවරණ ක්‍රමය මගින් නිර්මාණය කරන ලද අවකාශය බව නොරහසකි. එහෙත් ඒ කිසිදු දේශපාලන පක්ෂයක් හෝ වෙනත් අදෘශ්‍යමාන හස්තයක බලපෑමෙන් සිදුවූවක් නොව පාර්ලිමේන්තුව නියෝජනය කළ දේශපාලන පක්ෂවල අනුමැතියෙන් හා දැනුවත් වීමෙන් සිදු වූවකි. එලෙස සභිකයන් ප්‍රමාණාත්මකව වැඩි වූයේ වුව ද නිසි කළමනාකරණ භාවිතාවක් ඔස්සේ මෙකී සියලු සභිකයන් සඳහා පහසුකම් සැලකීම කළ නොහැක්කක් යැයි යන තර්කය කිසිසේත් පිළිගත නොහැකි ය. පළාත් පාලන ආයතන යනු ආදායම් ඉපයිය හැකි අන්දමේ ව්‍යුහයක් මත පිහිටුවා ඇති ස්වාධීන ආයතන විශේෂයකි. නිසි පරිකල්පනාත්මක මෙහෙයවීමක් සහිත නායකත්වයක් යටතේ පළාත් පාලන ආයතන අදායම් මූලාශ්‍ර බවට පත්කිරීම එතරම් අපහසු කටයුත්තක් විය නොහැකි ය.

මෙහිලා පැන නැගුණු අනෙක් ගැටළුව වන්නේ පළාත් පාලන ආයතන ප්‍රධානීන් තෝරා ගැනීමත් ස්ථාවර පළාත් පාලන ආයතන බිහිකරගැනීමත් පිළිබඳ ගැටළුවයි. මෙම නව මැතිවරණ ක්‍රමය හඳුන්වා දීමට ප්‍රථමව පැවති සංවාදය කේන්ද්‍රගත වූයේ ද්විපක්ෂ ක්‍රමයක් සහිත ප්‍රධාන දේශපාලන පක්ෂ පමණක් බලවත් වන ක්‍රමවේදයක් කිසිලෙසකින් හෝ ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් සඳහා හිතකර නොවන්නක් ලෙසටය. එහෙත් අදවනවිට උද්ගතව ඇති තත්ත්වය තුළ නගන ප්‍රතිතර්කය නම් එක් දේශපාලන පක්ෂයක් බලවත් නොවීම නිසා සභා අස්ථාවර වන බවයි. ප්‍රායෝගිකව මෙහිලා ගැටලුවක් ඇති බව පෙනී ගිය ද එකී තර්කය වැළඳ ගන්නා සියලුදෙනා චේතනාන්විතව අමතක කරන සත්‍යයක් ද ඇත. එනම් මෙරටේ පළාත් පාලන ආයතන නිර්මාණය වී ඇත්තේ පක්ෂ දේශපාලන පොරපිටියක් ලෙසින් නොව අවම පක්ෂ දේශපාලන ලැදියාවක් සහිත සභා විලාසයෙනි. එහෙත් මෑත කාලීනව පළාත් පාලන ආයතන දැඩිව දේශපාලනීකරණය වූ අතර ඉහත මූලධර්මය ද ක්‍රමිකව වැළලී යන සෙයක් දිස්විය. මහජන සේවයත්, උග්‍ර දේශපාලන ලැදියාවත් අතර නිෂ්චිත මායිමක් සළකුණු කර ගැනීමට නොහැකි පුද්ගලයන් සමූහයක් වෙත කවර මැතිවරණ ක්‍රමයක් ප්‍රදානය කළ ද ඉන් ඵලදායී යමක් සිදුවේදැයි යන්න මේ අනුව සිතා බැලිය යුතු කරුණකි. යම් සභිකයෙක් මුදලට දේශපාලන පක්ෂ තීරණ පාවා දීම යනු අභ්‍යන්තර ප්‍රජාතන්ත්‍රවාදයක් ඒ ඒ දේශපාලන පක්ෂ සතුව නැතැයි යන්නට කදිම සාධකයකි.

## ස්වකීය අභිමතය හා පක්ෂ දේශපාලනය

ඒ අනුව පෙනී යන කරුණක් වන්නේ මෙම වන මැතිවරණ ක්‍රමය නිසා වඩාත් නිරාවරණය වූයේ දේශපාලන පක්ෂ ප්‍රජාතන්ත්‍රවාදයේ දුබලතාවය බවයි. තවද යම් සාමාජිකයෙක් දේශපාලන පක්ෂයේ තීරණයට පිටුපාන ලද කලෙක ගතහැකි ක්‍රියාමාර්ග නව ඡන්ද විමසීම් පනතේ ඉතා පැහැදිලිව දක්වා ඇත්තේ මෙපරදිය.

10අ. (1) යම් පළාත් පාලන ආයතනයක සභිකයෙකු ලෙස තෝරාපත්කර ගනු ලැබීම පිණිස අපේක්ෂකයෙකු ලෙස යම් පිළිගත් දේශපාලන පක්ෂයක නාම යෝජනා පත්‍රයෙහි නම සඳහන් ව ඇති යම් තැනැත්තෙකු ඒ පක්ෂයෙහි සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇතැයි, ඒ පළාත් පාලන ආයතන ප්‍රදේශය පිහිටා ඇත්තේ යම් දිස්ත්‍රික්කයක ද ඒ දිස්ත්‍රික්කයේ ඡන්ද විමසීම් නිලධරයා

සැහීමට පත්වුවහොත් ඒ ඡන්ද විමසීම් නිලධරයා විසින්, (2) වන උපවගන්තියේ විධිවිධාන වලට යටත් ව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන දැන්වීමක් මගින් ඒ තැනැත්තා -

(අ) ඒ පළාත් පාලන ආයතනයෙහි සභිකයෙකු ලෙස තෝරාපත් කරගනු ලැබ සිටී නම්, ඒ තැනැත්තා ස්වකීය සභික ධුරය අත්හැර ඇතැයි හෝ

(ආ) යම් අනියම් පුරප්පාඩුවක් පිරවීම සඳහා ඒ පිළිගත් දේශපාලන පක්ෂයේ නාම යෝජනා පත්‍රයෙහි සිය නම තබා ගැනීමේ ස්වකීය අයිතිවාසිකම අහිමිකර ගෙන ඇතැයි

ප්‍රකාශ කරනු ලැබිය යුතුය. එවිට ඒ ප්‍රකාශය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි සිට අවස්ථාවෝචිත පරිදි, ඒ තැනැත්තා ඒ පළාත් පාලන ආයතනයේ සභිකයෙකු ලෙස දැරූ ස්වකීය ධූරය අත්හැරිය යුතුය.

අඬුව තිබියදී අත පුච්චා ගන්නා ආකාරයේ දේශපාලන සංස්කෘතියක දිවි ගෙවමින් සිට මැතිවරණ ක්‍රමයට විවේචන එල්ල කිරීම කවර තරම් ප්‍රහසණාත්මක දැයි වැටහෙන්නේ දේශපාලන පක්ෂ ඉහත නීතිමය ප්‍රතිපාදනය නොදැක්කා සේ කටයුතු කරනු දැකීමෙනි. බල දේශපාලන ව්‍යාපෘති හා න්‍යායික කරුණු අතර පරතරය වඩාත් පුළුල් බැවින් මෙවැනි නීති උපයෝගී කර ගැනීම ප්‍රයෝගික කරුණක් නොවන්නේ යැයි යමෙකුට තර්ක කළ හැකිය. එහෙත් කිසිවෙක් තමන් විසින් ම හඳුන්වා දී සම්මත කොටගත් නීතීන් ක්‍රියාවට නොනගන්නේ නම්, ඊට මැතිවරණ ක්‍රමය බිලි දිය යුතු නැති බව අවධාරණය කළ යුතුව ඇත. නව මැතිවරණ ක්‍රමයක් අත්හදා බැලීමේදී සිදු විය හැකි ආවේනික දුර්වලතා මෙහිදී ද විද්‍යමාන වූ අතර වෙනත් අවස්ථාවක දී මෙම දුර්වලතා යළිත් වරක් මතු වුවද එසේ විය හැක්කේ අවම වශයෙනි. ඊට හේතුව නම් මෙම නව අත්දැකීම් උපයෝගී කර ගැනීමේ අවකාශය එවනි අවස්ථාවකදී පැවතීමයි.

## ඉදිරි දැක්ම

නව මැතිවරණ ක්‍රමය මගින් ජනිත කරන ලද ප්‍රතිඵල අභිබවා මැතිවරණය හා සබැඳි තාක්ෂණික කරුණු පිළිබඳ දැඩි අවධානයක් යොමු කරමින් නව ක්‍රමයේ හැඩරුව විමසීම නවතා දැමීම වඩාත් උචිත කරුණක් බව මෙහිලා පෙනී යයි. නිදසුනක් ලෙස සභාපතිවරුන් තෝරා ගැනීමේ ක්‍රමවේදය සඳහා අනුදත් එක් ක්‍රමයක් වූයේ කුසපත් ඇදීමයි. එය ඉමහත් උත්කර්ෂයට නංවමින් එකී කරුණ නව මැතිවරණ ක්‍රමය විවේචනය කිරීම සඳහා යොදවනු දක්නට ලැබිණි. එහෙත් එකී විවේචකයන් නොදන්නා කරුණක් වන්නේ ජනාධිපතිවරයා තේරීමේ ක්‍රමවේදය තුළ පවා එකී ක්‍රමය අන්තර්ගත බවයි. මෙම නව මැතිවරණ ක්‍රමයේ පවත්නා අනෙකුත් මූලික ලක්ෂණ සහ ඉන් ජනමතය කවර ආකාරයකින් පිළබිඹු වන්නේ ද යන්න පිළිබඳ ඉදිරියේ දි කරුණු දැක්වීමට නියමිත ය. එහෙත් "සෑම ඡන්දයකටම සමාන අවස්ථාවක් ලබා දීම" සඳහා මිශ්‍ර සභික නියෝජන ක්‍රමයකින් හැර වෙනත් කවර හෝ ක්‍රමයකින් හැකි වේ දැයි සිතීම දුෂ්කර කරුණකි.

වඩාත් වැදගත් වන්නේ වඩාත් පුළුල් විචාරාක්ෂියකින් යුක්තව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම පිළිබඳ විමසා බලා ප්‍රතිපත්තිමය තීරණ සඳහා එළඹීමයි. එය ඉදිරි පළාත්සභා ඡන්ද විමසීම සාර්ථක කරගැනීම සඳහා ඉවහල් වන කරුණකි. එවැනි සාච්ඡාවක දී වැඩි අවධානයක් යොමු කළ යුතු කරුණු කිහිපයක් පහත දක්වා ඇත.

- අමතර ලැයිස්තුව යටතේ සභිකයන් නම් කිරීම සඳහා පක්ෂ ලේකම්වරයා සතු බලය
- කාන්තා නියෝජනය අනිවාර්ය කිරීමට පනවා ඇති සීමාවන් සහ නිදහස් කිරීම් (නිදෘ 20% ප්‍රතිශතය හා සභිකයන් 3 ට අඩුවෙන් ලබාගන්නා පක්ෂ සඳහා කාන්තා නියෝජනය අනිවාර්ය නොකිරීම)
- 50 ට 50 අනුපාතය සහිත මිශ්‍ර මැතිවරණ ක්‍රමයක් තුළ එල්ලන ආසන ප්‍රමාණය (over hang) කවරාකාරවේද යන්න හෝ ඊට ප්‍රතිපක්ෂව පෙර ක්‍රමය යටතේ ප්‍රසාද ආසන ලබා දීම
- කඩඉම් ප්‍රතිශතය (පෙර පැවති 5% ක ප්‍රතිශතයකි) නැවත හඳුන්වා දීම හෝ ඊට අදාළ වෙනත් විකල්ප.

මෙලෙස නිර්මාණය වී ඇත්තේ ඉහත කරුණු සියල්ල විචාරාත්මකව අවධානයට යොමු කළ හැකි පෙරබිමක් වන අතර පළාත්සභා මැතිවරණය පැවැත්වීමට ප්‍රථම ඉහත කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම කාලීන අවශ්‍යතාවයකි. තවද පළාත් පාලන ඡන්ද විමසීම සඳහා උපයෝගී කරගත් මිශ්‍ර සහික නියෝජන ක්‍රමය වඩාත් සාර්ථකව ක්‍රියාවට නැගීමට නම් සිදුකළ යුතු ප්‍රමුඛතම කාර්යයක් වන්නේ ඡන්ද පත්‍රිකා දෙකක් ඡන්දදායකයා වෙත ලබා දීමේ ක්‍රමවේදයක් කරා යාමයි. එවිට තම අභිලාශය පරිදි අපේක්ෂකයන් මෙන්ම දේශපාලන පක්ෂ ද තෝරා ගැනීමේ වරණය ඡන්දදායකයා සතු වන අතර ජනමතය එලෙසම ප්‍රතිනිර්මාණය කිරීම සඳහා අවස්ථාවක් උදාවන්නේය. එලෙස සිදුනොවන තාක් කල් මෙවැනි ක්‍රමයක් "හිස නැති කවන්ධයක් හා සමානය". සංවාදයෙන් ක්‍රියාකාරීත්වයට යොමුවීම සැමගේ හිත සුව පිණිස වන්නේ ය.

***ලිපි සම්පාදනය : නීතීඥ ගයනි ප්‍රේමතිලක සහ මංජුල ගජනායක, ජාතික සම්බන්ධීකාරක, මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය (CMEV).***